# පාරම්පරික දැනුම

අප රට සතු දිගු ඉතිහාසයත් බුදු දහමින් පෝෂණයවූ සමාජ පරිසරයත් හේතුවෙන් අප ලොව විස්මිත දෑ කලාවූ ජාතියක් වශයෙන් ප්‍රකටය.

මහින්දාගමනයත් සමග විවිධාකාර ක්ෂේත්‍රයන් ගණනාවක විකාශනය ඇරඹුනු අතර එමගින් අපටම ආවේනික ඌරුවකින් යුතු නිර්මාණයන් බිහිවීම ආරම්භ විය.



නෙත්තිපොල ගෙදර රජමහා විහාරයේ තිබූ පෙතිකඩ රූපය



ලී සිරස්පත

අදටත් නවීන විද්‍යාව මගින් තහවුරු කිරීමට අපොහොසත් බොහෝ නිර්මාණයන්, ක්‍රමවේදයන් අප සංස්කෘතියේ ගැබ්ව ඇත. ඒ සියල්ල සඳහාම පදනම වී ඇත්තේ අපගේ පාරම්පරික දැනුමයි.

## පාරම්පරික දැනුම යනු

යම් නිශ්චිත භූගෝලීය සීමාවන් තුල හෝ ප්‍රදේශයක ජීවත්වන ජනතාව දරා සිටින දැනුම් සම්භාරය එකී භූගෝලීය සීමාවන් වලින් දැක්වෙන ප්‍රදේශයට / ජනතාවට අයත් පාරම්පරික දැනුම වේ.





බත් කූඩාය සහ බුලත් වංගෙඩිය

## පාරම්පරික දැනුමේ ලක්ෂණ

- අනාදිමත් කාලයක සිට පරිසරය භාවිතයෙන් ලද අත්දැකීම් මත ගොඩනැගුණු දැනුමකි.
- පරම්පරාවෙන් පරම්පරාවට උරුමවන දැනුමකි.
- මුඛ පරම්පරාවෙන් (කට වහරින්) පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරයි.
- මෙම දැනුම ලේඛන ගතවී නොමැති අතර ව්‍යවහාරයේ පවතී.
- පවතින සංස්කෘතියට හා ප්‍රදේශයට ආවේණිකය.

## හැගව ශ්‍රී සුමංගල විද්‍යාලයීය

## ගැමි කෞතුකාගාරය

කු/ ගිරි/ හැගව ශ්‍රී සුමංගල විද්‍යාලය 1953 වසරේ ආරම්භ කරන ලද පාසැලක් වන අතර එහි ගැමි කෞතුකාගාරය 2003 වසරේදී ආරම්භ කර ඇත. විද්‍යාලයේ විදුහල්පතිතුමන්ගේත්, ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ගේත් හා සිසු දරු දැරියන්ගේ මහත් කැපවීම හා උනන්දුව මත පවත්වාගෙන යන මෙම ගැමි කෞතුකාගාරය සතුව අප සතු පාරම්පරික දැනුම පිළිබඳව හා එම දැනුම යොදාගත් ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු අන්තර්ගතය.

## පාරම්පරික ගොවිතැන

පරිසරයේ සමතුලිතතාවය පවත්වා ගනිමින් නිරෝගී ජාතියක් බිහිකිරීම සඳහා වැදගත්වූ අපගේ පාරම්පරික ගොවිතැන සඳහා යොදාගත් උපකරණ රැසක් මෙම ගැමි කෞතුකාගාරය සතුව ඇත. ඒ අතර නගුල, වියගහ, පෝරුව, දිය හොල්මන ආදී ගොවිතැන සඳහා යොදාගත් පැරණි උපකරණ විශේෂ තැනක් ගනී.

## දේශීය වෛද්‍ය ක්‍රම



බෙහෙත් හෙප්පු

දේශීය වෛද්‍ය ක්‍රමයට අදාල පුස්කොලපොත් රාශියක් ගැමි කෞතුකාගාරය සතුව ඇත.



පුස්කොල පත් ඉරු හා පත්ගිඳ

## පාරම්පරික ධීවර කර්මාන්තය

අතීතයේ පටන් රට අභ්‍යන්තර ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාලීම සඳහා යොදාගත් මිරිදිය ධීවර කර්මාන්තයට අදාල ඉරටිය, කරක් ගෙඩිය, කෙමන ආදී උපකරණ මෙම ගැමි කෞතුකාගාරයේදී දැකගත හැක.



ඉරටිය



කෙමන

## පන් කර්මාන්තය

පාරම්පරික ගෘහ කර්මාන්තයක් වශයෙන් අතීතයේ පටන් පැවත එන පන් කර්මාන්තය තුල පන් නෙලීම, වියලීම මෙන්ම පන් පාට පෙවීම ආදී සියලුම කාර්යයන් සඳහා පාරම්පරික දැනුම යොදාගනී. අතීතයේ කාන්තාවන් ස්වකීය විවේකය පන් ආශ්‍රිත විවීම් සඳහා යොදාගෙන ඇත. මෙම කෞතුකාගාරය සතුව පවතින වංකගිරි රටා පැදුර, තුංපත් රටා පැදුර, අංක රටා පැදුර, හයමුළු වට්ටිය, බත් මල්ල ඒ සඳහා උදාහරණයන්ය.





## පාරම්පරික ජන ක්‍රීඩා

අප සංස්කෘතික උරුමයන් වන ජන ක්‍රීඩා හා සම්බන්ධ උපකරණයන්ද ගැමි කෞතුකාගාරය සතුව ඇත. ඔළිඳ පුවරුව, පංච පෙත, පොරපොල් ක්‍රීඩාවට යොදාගන්නා පොර පොල්, දිවුල් බඹරය, උණ වෙඩි බම්බුව ඒ අතර ප්‍රධාන තැනක් ගනී.



ඔළිඳ පුවරුව



අං ඇදීමට යොදාගන්නා අං සහ පොර පොල්

## සාම්ප්‍රදායික පිත්තල උපකරණ





ගිරය සහ හෙඩි පහන

ඉපැරණි කාසි, පිඟන් භාණ්ඩ, පුස්කොලපොත් හා පන්හිඳ, අතීත ප්‍රභූ නිලධාරීන්ගේ නිල ඇඳුම්, කිරුම් මිනුම් උපකරණ, පිටපත් කල සිතුවම් ආදී පුරා වස්තු රැසක් මෙම ගැමි කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා තැන්පත් කර ඇත.




## ඔබටත් අවස්ථාවක්

ඔබ සතුව යම් පුරාවස්තු හෝ මෙම ගැමි කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා සුදුසුයැයි සිතන භාණ්ඩ පවතී නම් ඒවා මෙම කෞතුකාගාරයට පරිත්‍යාග කිරීමට ඔබට අවස්ථාව ඇත. එය අප සතු උරුමයන් අනාගත පරම්පරාවට උරුමකර දීමේ ජාතික මෙහෙවරක්ම වන්නේය.

## පිවිසුම් මාර්ගය හා විස්තර

කුලියාපිටිය පන්නල ප්‍රධාන පාරේ පැමිණ ලැයිම හංදියෙන් හැරී කු/ගිරි/හැඟව ශ්‍රී සුමංගල විද්‍යාලයට ලගාවිය හැක. විදුහල්පතිතුමාගෙන් ලබාගන්නා පූර්ව අවසරයකින් මෙම ගැමි කෞතුකාගාරය නැරඹීමට ඔබටත් අවකාශ ඇත. (දුරකථන අංක 0602986942 / 0602376496)

පාරම්පරික දැනුම අප සතු උරුමයයි !

අධ්‍යක්ෂ
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
අංක 342, සූවිහවුස් ගොඩනැගිල්ල, පිටකෝට්ටේ.

සැකසුම
ටී.එම්.අනුරුද්ධ හෙන්නකෝන්
පරිසර කළමනාකරණ නිලධාරී
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

# පාරම්පරික දැනුම අප සතු උරුමයයි

## ගැමි කෞතුකාගාරය

### කු/ගිරි/හැඟව ශ්‍රී සුමංගල විද්‍යාලය
### හැඟව, යක්විල.



ප්‍රදර්ශනය කෙරෙන මාවතගම රජමහා විහාරයේ බිතුසිතුවමක පිටපතක්

**ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය**
**පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය**